02 01438

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීති වේදී උපාධි පාඨමාලාව - 2017/18

අවසාන පරීක්ෂණය - තෙවන මට්ටම

ශ්‍රී ලංකාවේ නීතිය පිළිබඳ හැඳින්වීමක් – **LWU1411/LLU3703**

කාලය - පැය (03) තුනයි

........................................................................................................

දිනය : 2020 පෙබරවාරි 28 වේලාව : පෙ.ව. 9.30 ප.ව. 12.30

........................................................................................................

මුළු ප්‍රශ්න ගණන 08 යි

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ

ප්‍රශ්න 05 (පහකට) පමණක් පිළිතුරු සපයන්න

**01.** සිවනේෂන් යාපනයේ ද්‍රවිඩ දෙමාපියන්ට දාව මලයාවේ උපත ලැබීය. පාසල් අධ්‍යාපනය යාපනයෙන් ලැබීමෙන් පසුව ඔහු උසස් අධ්‍යාපනය සඳහා කොළඹ පැමිණි අතර කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයට ඇතුළත් විය. දිවුරුම් දීමෙන් අනතුරුව ඔහු 2001 වර්ෂයේ නීතීඥවරයෙකු ලෙස කටයුතු කිරීම ආරම්භ කළේය. සිවනේෂන්, එකම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ ගුරුවරියක වන යාපනයේ ජීවත් වන රාධා නම් ද්‍රවිඩ කාන්තාවක් සමඟ 2003 දී විවාහ විය. ඔවුන්ගේ විවාහ මංගල්‍යය යාපනයේ පැවති අතර ඔවුන්ගේ වෘත්තීය කටයුතුවල යෙදීමේ අරමුණින් ඔවුහු කොළඹ වාසය කළහ. ඔවුනට දරුවන් දෙදෙනෙකු සිටින අතර ඔවුන් වැල්ලවත්ත හින්දු ප්‍රාථමික විද්‍යාලයේ අධ්‍යාපනය ලබයි. සිවනේෂන් සහ රාධාගේ දෙමාපියන් දෙදෙනාම යාපනයේ ජීවත් වේ. සෑම මාසයක් හැර මාසයකම සිවනේෂන් පවුල යාපනයට යාමට පුරුදුව සිටියේය. සිවනේෂන් යාපනයේ ඉඩම් සහ වෙනත් දේපළ අත්පත් කරගෙන තිබූ අතර ඔහුගේ දෙමාපියන්ගේ පාරම්පරික නිවස ආසන්නයේ නිවසක් ඉදිකිරීමට අපේක්ෂා කළේය. 2019 දී සිවනේෂන් රිය අනතුරකට ලක් වීමෙන් මිය ගියේය.

සිවනේෂන් ඔහුගේ සහෝදරයා වූ කමලේෂන් සමඟ චාවකච්චේරි හි ඉඩමක සම හිමිකාරිත්වය දැරීය. කමලේෂන් සිවනේෂන්ට නොදන්වා ඔහුගේ ඉඩම් කොටස 2018 දී විකුණා ඇත .

රාධාට ඇය සහ සිවනේෂන් පාලනය වන්නේ කුමන නීතියෙන් ද යන්න සහ චාවකච්චේරියේ ඉඩමට අදාළ නීතිමය ප්‍රශ්න පිළිබඳ දැනගැනීමට අවශ්‍යව ඇත.

රාධාට උපදෙස් දෙන්න. අදාළ නඩු තීරණ සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 20)

**02.** පහත දැක්වෙන නඩු තීන්දුවල වැදගත්කම නඩුවේ පාර්ශවයන් පාලනය වන්නා වූ විශේෂ නීති ඇසුරින් පැහැදිලි කරන්න

i. *විලියම් එ. රොබට්සන්* (ලකුණු 06)

ii. *සිවඥානලිංගම් එ. සුන්දරලිංගම්* (ලකුණු 07)

iii. *නටාලි මානෙල් අබේසුන්දර එ. ක්‍රිස්ටෝපර් අබේසුන්දර* (ලකුණු 07)

**03.** දේවින්ද, මාතලේ කලාප අධ්‍යාපන කාර්යාලයට අනුයුක්ත අධ්‍යාපන අධ්‍යක්ෂකවරයෙකි. ඔහුගේ පියා, කිරිබණ්ඩා ගොවියෙක් වන අතර අම්බලන්ගොඩ සිට පැමිණි දේවින්දගේ මව චන්ද්‍රානි සමඟ ගම්පොළ ජීවත්වේ. ඔවුන් 1948 වර්ෂයේදී විවාහ වී ඇත . මාතලේ විද්‍යා විද්‍යාලයේ සේවය කරන ගුරුවරියක වන උදාරි දේවින්දට හමු විය. උදාරිගේ දෙමාපියන් නුගේගොඩ ජීවත්වේ. වසර දෙකක ප්‍රේම සම්බන්ධතාවයකින් පසුව දේවින්ද සහ උදාරි විවාහ වීමට තීරණය කළෝය. දේවින්දගේ දෙමාපියන්ට ඔවුන්ගේ විවාහය උඩරට නීතිය යටතේ ලියාපදිංචි කිරීමට අවශ්‍යය. නමුත් උදාරිගේ දෙමාපියන්ට ඔවුන්ගේ විවාහය සාමාන්‍ය නීතිය යටතේ ලියාපදිංචි කිරීමට අවශ්‍යව ඇත . දේවින්ද සහ උදාරි ඔවුනගේ විවාහය උඩරට සහ සාමාන්‍ය නීතිය යටතේ ලියාපදිංචි කිරීමේ හැකියාව පැහැදිලි කර ගැනීමට අපේක්ෂා කරයි.

i. කිරිබණ්ඩා, චන්ද්‍රානි, දේවින්ද, උදාරි සහ උදාරිගේ දෙමාපියන් යන එක් එක් පාර්ශවයන්ට අදාළ වන නීතිය හඳුනාගනිමින් ඉහත සිද්ධිය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ii. ඔවුන්ගේ විවාහය උඩරට නීතිය යටතේ ලියාපදිංචි කිරීමේ හැකියාව පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. දේවින්දගේ පියා පහතරට සිංහලයකු සහ ඔහුගේ මව උඩරට කාන්තාවක වූවානම් සහ ඔවුන් 1950 දී බින්න විවාහයක ට එළඹ තිබුණේ නම් ඔබ **(ii)** කොටසට ලබා දුන් පිළිතුර වෙනස් වන්නේද? (ලකුණු 05)

**04.** "මෙම ආඥා පනත මගින් හෝ ලංකාවේ ක්‍රියාත්මක වන වෙනත් යම් නීතියකින් විධිවිධාන සළසා නොමැති සාක්ෂි පිළිබඳ ගැටලුවක් අධිකරණ කටයුත්තකදී ඉස්මතු වන අවස්ථාවකදී එකී ගැටලුව දැනට ක්‍රියාත්මක වන ඉංග්‍රීසි සාක්ෂි නීතිය අනුව තීරණය කළ යුතුය"

- *1895 අංක 14 සාක්ෂි ආඥා පනත 100 වගන්තිය*

ඉංග්‍රීසි නීතිය විවිධ ක්‍රම ඔස්සේ ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් බවට මෙම ව්‍යවස්ථා මගින් සාක්ෂි සපයයි. ව්‍යවස්ථා මගින් ඉංග්‍රීසි නීතිය ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් විවිධ ක්‍රම සාකච්ඡා කරන්න. අදාළ ව්‍යවස්ථා සහ නඩුතීරණ මගින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 20)

05. i. මොහම්මදික නීති සංග්‍රහය මුස්ලිම් නීතිවල අංග සම්පූර්ණ එකතුවක් නොවීය. එහි හිස්තැන් රාශියක් වූ අතර සෑම නීති ප්‍රදේශයක්ම ආවරණය නොවීය. රෝම ලන්දේසි නීතිය සහ ඉස්ලාමීය නීතිය යන දෙකම අදාළ කර ගනිමින් මෙම ගැටලුව විසඳීමට අධිකරණය උත්සාහ දරන ලදී.

ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 10)

අ) රියාන් සමග අස්රා විවාහ විය. විවාහ වන අවස්ථාව වන විට ඔවුහු ඉස්ලාම් ආගම ඇදහූහ. ඔවුනට දරුවන් නොමැති අතර ඔවුහු සානියා නැමති දරුවකු හදා ගැනීමට තීරණය කළහ. ඇයගේ විවාහය සිදු වන අවස්ථාවේ සානියාට නිවසක් සහිත ඉඩමක් තෑගි කිරීමට රියාන්ට අවශ්‍ය විය. (ලකුණු 05)

ආ) අසීස් ෆාතිමා සමග විවාහ විය. විවාහ වන අවස්ථාව වන විට ඔවුහු දෙදෙනාම ඉස්ලාම් ආගම ඇදහූහ. රෝමානු කතෝලික කාන්තාවක වූ අන්ජලී අසීස්ට මුණ ගැසුනු අතර ඇය විවාහ කර ගැනීමට අසීස් තීරණය කළේය. පෙර පැවති විවාහය පවතින විටම ඔහු රෝමානු කතෝලිකයකු බවට පත්ව අන්ජලී විවාහ කර ගත්තේය.

(ලකුණු 05)

ඉහත සිදුවීම් මඟින් හට ගන්නා නෛතික ගැටලු සාකච්ඡා කරන්න. විනිශ්චිත නඩු තීරණ සහ ව්‍යවස්ථා මඟින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

06. 'එකම අධිකරණ බල ප්‍රදේශයක් තුළ එකිනෙක හා ගැටෙන නෛතික මූලධර්ම සහ සංකල්ප අදාළ වන විට නීති අතර ගැටුම් ඇති විය හැකිය. එවැනි ගැටුම් පෞද්ගලික නීති අතර මෙන්ම පෞද්ගලික නීති සහ බලවත් සාමාන්‍ය නීතිය අතර ඇති විය හැක. එසේම බලවත් සාමාන්‍ය නීතිය ඇතුළත පවා එනම්, ඉංග්‍රීසි නීතිය සහ රෝම ලන්දේසි නීතිය අතර නීති ගැටුම් ඇති විය හැකිය.'

ශ්‍රී ලංකාවේ නීති පද්ධතියෙහි ඇති බහුවාදය පිළිබඳ ගැටලු ඉහත ප්‍රකාශය ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

07. එක්සත් පළාත්වල රජය යටතේ ලංකාවේ අදාළ වන රෝම ලන්දේසි නීතිය ලංකාවේ පොදු නීතියේ ආරම්භක ස්ථානය වන නමුත් එය අවසන් වන අවස්ථාව නොවේ. එංගලන්තයේ පොදු නීතිය මෙන් ලංකාවේ පොදු නීතිය 1799 සිට අචලව පැවත නොමැත. ලංකාවේ සමාජයේ වෙනස් වන තත්ත්වයන් මඟින් ඇති කරනු ලබන්නා වූ නෛතික ගැටලුවලට විසඳුම් සෙවීමේදී රෝම ලන්දේසි නීතියේ මූලික සිද්ධාන්ත ලංකාවේ අධිකරණ විසින් අදාළ

01438

කරනු ලබන හෙයින් *(සමීඩ් එ සේගුතම්බි)* රෝම ලන්දේසි නීතිය කාලයත් සමග අධිකරණ භාවිතාවන් මගින් ප්‍රගතිශීලීව වර්ධනය වන විෂයක් වී ඇත.

*කෝඩේශ්වරන් එ. නීතිපති (1969) 72 N.L.R. 337 පිටුව 342*

රෝම ලන්දේසි නීතිය ශ්‍රී ලංකාවේ පොදු නීතිය බවට විකාශය වීම ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 20)

**08.** පහත ඕනෑම මාතෘකා <u>දෙකක් (02)</u> පිළිබඳ සටහන් ලියන්න

**i.** ශ්‍රී ලංකාවේ පූර්ව යටත්විජිත යුගය තුළ යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදය.

**ii.** 1505 සහ 1832 අතර කාලය තුළ යටත්විජිත පාලකයන් යටතේ යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදය.

**iii.** නිදහසින් පසු යුගය තුළ අධිකරණ පද්ධතිය සහ යුකිත්ය පසිඳලීම.

(ලකුණු 10 x 2 = 20)

**** *නිමිකම් ඇවිරිණි* ****